# මහජන ආරක්ෂක අමාත්‍යාංශය
# ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
# ලංසු ආරාධනය

## ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ වැලිසර හා මිරිහාන රැඳවුම් මධ්‍යස්ථානයේ රැඳවියන් සඳහා ආහාර සැපයීම

**කොන්ත්‍රාත් අංකය: DIE/PRO/05/2024/74**

01. ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් වැලිසර හා මිරිහාන රැඳවුම් මධ්‍යස්ථානවල රැඳවියන් සඳහා ආහාර සැපයීමට යෝග්‍යතා පූර්ණ සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

02. මෙම ලංසුකරණය ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියා පටිපාටිය යටතේ පැවැත්වේ.

03. මේ පිළිබඳව උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට වැඩිමනත් විස්තර 2024.06.20 දින සිට 2024.07.09 දක්වා ඕනෑම රාජකාරී දිනයකදී පෙ.ව.9.00 හා ප.ව.3.00 දක්වා කාලය තුළ බත්තරමුල්ල, ශ්‍රී සුභූතිපුර පාර, "සුහුරුපාය", 05 වන මහලේ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන අංශයේ නියෝජ්‍ය පාලක (ප්‍රසම්පාදන) වෙතින් ලබා ගත හැකි අතර, එම ලිපිනයේදීම ලංසු ලිපිලේඛන නොමිලේ පරීක්ෂාව සිදු කළ හැක.

**ඇමතුම් දුරකථන අංකය 011-2101559**

04. ආපසු ගෙවනු නොලබන රුපියල් පන්දහස් පන්සීයක (රු. 5,500.00) ගාස්තුවක් ගෙවීමෙන් හා ලිඛිත අයදුම්පතක් නියෝජ්‍ය පාලක (ප්‍රසම්පාදන), 05 වෙනි මහල, බී පර්යන්තය, ප්‍රසම්පාදන අංශය, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, "සුහුරුපාය", ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2024.06.20 වෙනි දින සිට 2024.07.09 දක්වා රාජකාරී දිනයන්හි පෙ.ව. 9.00 හා ප.ව.3.00 අතර, මුද්‍රිත සම්පූර්ණ ලංසු ලිපිලේඛන කට්ටලයක් ලබා ගත හැකිය. ගෙවීම් ක්‍රමය මුදලිනි.

05. සම්පූර්ණ කරන ලද ලංසු, "මුල් පිටපත" (Original) හා "අනුපිටපත" (Duplicate) ලෙස පිටපත් 2කින් යුතුව සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, 5 වන මහල, "බී" පර්යන්තය, ප්‍රසම්පාදන අංශය, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, සුහුරුපාය, ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල යන ලිපිනයට 2024.07.10 වැනි දින ප.ව. 2.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගෙනවිත් භාරදීම සිදු කළ හැක. ලංසු කැඳවීම අවසන් වූ වහාම ඉහත දක්වා ඇති ලිපිනයේදී, පැමිණීම සඳහා කැමැත්ත දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේදී ලංසු විවෘත කිරීම සිදුකරනු ලැබේ. ප්‍රමාද වී ලැබෙන ලංසු භාර නොගන්නා අතර, එම ලංසු විවෘත නොකර ආපසු භාරදීම සිදු කරනු ලැබේ.

06. ලංසුකරු විසින් භාරදෙනු ලබන ලංසුව, ලංසු භාරගන්නා අවසාන දින සිට දින 77 කාල සීමාවකට හෝ ඕනෑම දිගුකරන කාල පරිච්ඡේදයක් සඳහා වලංගු භාවයෙන් යුක්ත විය යුතුය.

07. සියලුම ලංසු, ලංසු ලේඛනයේ 3.3හි දක්වා ඇති ආකෘතියේ පරිදි ලංසු සුරක්ෂණයක් සමග ආගමන හා විගමන පාලක ජනරාල් වෙත (ලිපිනයට) එවිය යුතු අතර, ලංසු සුරක්ෂණය රු. 400,000.00 ක වටිනාකමකින් යුතු 2024.10.22 දින තෙක් වලංගු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කළ ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන වාණිජ බැංකුවකින් නිකුත් කරන ලද්දක් විය යුතුය.

08. පූර්ව ලංසු රැස්වීම 2024.07.01 වැනි දින ප.ව. 2.00 ට "සුහුරුපායෙහි" 5 වන මහලෙහි පිහිටි ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන අංශයේ දී පැවැත්වේ.

**අයි.එස්.එච්.ජේ.ඉලුක්පිටිය**
**පාලක ජනරාල්,**
**ආගමන හා විගමන දෙපාර්තමේන්තුව,**
**"සුහුරුපාය", ශ්‍රී සුභූතිපුර පාර,**
**බත්තරමුල්ල.**